සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල - 2025

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදෙලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 106,356,702 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 324,154,748 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 430,511,450 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2025 සැප්තැම්බර් 04 දිනැති අංක අමප/25/1531/804/179 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමත කරන ලද, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII වන කොටසේ 39 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පත් කරන ලද අරමුදල් සමාලෝචන කමිටුවේ 2025 ජූලි 02 දිනැති වාර්තාවේ 6 වන ඡේදය ප්‍රකාරව, මෙම අරමුදල නීතිපතිවරයාගේ උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කළ යුතු අරමුදලක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව නීතිපතිවරයාගේ උපදෙස් ලබාගෙන තිබුණද, එම උපදෙස් අනුව අරමුදලේ අනාගත පැවැත්ම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග හා ඊට අදාළ නෛතික කටයුතු මෙම වාර්තාවේ දිනය වන විටත් අවසන් කර නොතිබුණි.	නීතිපතිගෙන් විමසා අදාළ තීරණය ලැබී ඇති අතර මේ පිළිබඳ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. දෙපාර්තමේන්තුවේ මෙම කටයුතු විධිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ විගණන කළමනාකරණ කමිටුවේ සාකච්ඡා වූ පරිදි පත්කරන ලද විශේෂ කමිටු මගින් මෙම අරමුදල් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරනු ලැබේ.	2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව අදාළ කටයුතු සඳහා ලබා දී ඇති කාලසීමාව අවසන් වී ඇති බැවින්, නීතිපතිවරයාගේ උපදෙස් හා අදාළ නීතිමය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙම අරමුදල සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ විශේෂ නිවාස වැඩසටහන යටතේ නිවාස 911ක් සඳහා රු.136,650,000ක පළමු අදියරේ ප්‍රතිපාදන ඇතුළුව මඩකලපුව හා රත්නපුර දිස්ත්‍රික්ක සඳහා අතිරේකව රු.1,400,000ක් මුදල් නිදහස් කර තිබුණද, ඉන් රු.13,350,000ක් වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ආපසු ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කර තිබුණි. තවද, 2024 වර්ෂයේදී නිවාස 1,377ක් සඳහා රු.662,600,000ක් වැයකර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේදී නිවාස 918ක් සඳහා රු.123,050,000ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව, පෙර වර්ෂයට සාපේක්ෂව නිවාස වැඩසටහන සඳහා වූ වියදම රු.539,550,000කින් හෙවත් සියයට 81කින් අඩු වී තිබුණි. මෙම වැඩසටහනට අදාල චක්‍රලේඛය 2025 අගෝස්තු මාසයේදී නිකුත් කිරීම හා ප්‍රතිපාදන නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී නිදහස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම සීමා වී තිබුණි.	2025 වර්ෂයේදී නිවාස වැඩසටහන ආරම්භ කිරීමට, මාර්තු මාසයේදී කටයුතු සැලසුම් කළ අතර මෙම වර්ෂයේදී නිවාස සව්බලගැන්වීමට නියමිත පවුල් තෝරා ගන්නා තුරු චක්‍රලේඛය නිකුත් කිරීම ප්‍රමාද වීම සිදුවිය. ඒ අනුව සව්බලගැන්වීමට නියමිත පවුල් දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගන්නා ලද අතරතුර ලද උපදෙස් අනුව 2025 අගෝස්තු මාසයේදී චක්‍රලේඛය නිකුත් කරන ලදී. ඉන් අනතුරුව චක්‍රලේඛය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාස හා බිම් මට්ටමට ලබාදෙමින් නිවාස යෝජනා තෝරාගෙන නිර්දේශ ලබාගනිමින් ප්‍රධාන කාර්යාලය මගින් නිවාස යෝජනා පරීක්ෂා කර බලා සුදුසු යෝජනා තෝරා ගනිමින් නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. ඒ අනුව මුදල් නිදහස් කිරීම 2025 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී සිදු කරන ලදී. නිවාස 911ක් සඳහා මුදල් නිදහස් කළ අතර "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් නැවත නිවාස 100ක මුදල් ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලයේ නිවාස ගිණුමට බැර කර ඇත. වෙනත් වර්ෂවල පරිදි නිවාස වැඩසටහන සඳහා විශාල නිවාස ප්‍රමාණයක් ඉදිකිරීමට ප්‍රමාණවත් මුදල් ගිණුමේ තැන්පත් කර නොමැත. එම නිසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට 03 බැගින් නිවාස 1020 ක් ලෙස හා අභියාචනා කිහිපය බැගින් 2025 වර්ෂයේ සිට ලබාදීමට නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලය සාකච්ඡා කර ඇත. මෙහිදී නිවාස අරමුදල අඩුවන හෙයින් ඉතිරි වර්ෂ කිහිපයක් සඳහා මේ ආකාරයට නිවාස ලබාදීමට සැලසුම් කර ඇත.	නිවාස වැඩසටහන කාලෝචිතව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නියමිත කාලයට නිකුත් කිරීමටත්, අනුමත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි ප්‍රතිපාදන නිදහස් කිරීමටත් කළමනාකරණය කටයුතු කළ යුතුය.
(ආ)	ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නිවාස 07ක් ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම් කටයුතු සඳහා රු.3,750,000ක් ලබාදී තිබුණි.		
(i)	2024 පෙබරවාරි 07 දිනැති අංක 2024/03 දරන සමෘද්ධි චක්‍රලේඛයේ 01 වැඩසටහන ක්‍රියාත්මක කිරීම	ප්‍රතිලාභියෙකුට රන්විමන නිවාස යෝජනාව සඳහා රු.750,000 ක මුදලක් රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය වෙත නිදහස්	ඉදිරි වර්ෂයේදී අරමුදලේ ප්‍රධාන කාර්යයක් වන නිවාස ඉදිකිරීම සඳහා

	යටතේ 3 II “තෝරා ගැනීමේ ක්‍රියාවලිය” අනුව නිවාස ඉදිකිරීම සඳහා තමා සතු ඉඩමක් හිමි පවුලක් තෝරාගත යුතු වුවද, එක් ප්‍රතිලාභියෙකුගේ නිවස ඉදිකිරීම සඳහා තෝරාගත් ඉඩම සඳහා නීත්‍යානුකූල හිමිකම් ලේඛනයක් නොතිබූ අතර, තවත් ප්‍රතිලාභියෙකුගේ නිවස මහවැලි අධිකාරිය සතු ඉඩමක ඉදිකර තිබුණි. ඒ අනුව, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් ප්‍රමාණවත් ලෙස තහවුරු කර නොතිබීම හේතුවෙන් තෝරා ගැනීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් පැවතුණි.	කර ඇත. 2024 ඇය නමින් ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයෙන් නිකුත් කරන ලද 19 වගන්තියේ 4 වන උප වගන්තිය යටතේ ප්‍රදාන පත්‍රය මගින් මුල් ඉඩමෙන් කොටසක් හිමි බවට තහවුරු කරගෙන ඇත. ඒ අනුව 2024/3 චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් අයිතිය පවරා ගෙන ඇති ඉඩමක අයිතිය පිළිගනු ලැබේ. ප්‍රතිලාභියෙකුට නිවාස යෝජනාව අභියාචනා නිවාස රු. 750,000 යටතේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය වෙත නිදහස් කර ඇත. එම ඉඩම මහවැලි අධිකාරිය සතු ඉඩමක් බව මහවැලි අධිකාරියේ ලිපියක් මගින් තහවුරු කර ඇත. 2024/03 චක්‍රලේඛ ප්‍රකාරව අයිතිය නොමැති වුවද අදාල එකඟතාවය මත නිවාස ඉදි කිරීම සඳහා අවසර ලබා දී ඇත.	අවශ්‍ය ආධාර ලබාදීමේදී චක්‍රලේඛ මගින් ලබා දී ඇති උපදෙස් අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීමත්, ඒ අනුව ඉඩම්වල නීත්‍යානුකූල හිමිකම් තහවුරු කර ගැනීමෙන් අනතුරුව අරමුදල් ලබාදීමටත් කටයුතු කළ යුතු අතර ඉදිරියේදී මෙවැනි තත්වයන් වලක්වා ගැනීමට වගබලා ගත යුතුය.
(ii)	ඉහත චක්‍රලේඛය අනුව 2024 නොවැම්බර් 15 දිනට පෙර නිවාස ඉදිකිරීම් අවසන් කර සියලු ගෙවීම් කටයුතු නිම කළ යුතු වුවද, එක් ප්‍රතිලාභියෙකු වෙත රු.750,000ක නිවාස ආධාර ලබාදී තිබියදීත්, නිවසේ විශාල අත්තිවාරම පමණක් ඉදිකර තිබූ අතර ඉතිරි ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණි. ඒ අනුව, ලබාදුන් ආධාරය අපේක්ෂිත අරමුණ සඳහා කාලීනව උපයෝජනය වී නොතිබුණි.	ප්‍රතිලාභියෙකු වෙත අභියාචනා යටතේ රු. 750,000 ක නිවාස ආධාර ලබාදී ඇත. මෙම මුදල වාරික 3 ක් යටතේ රු. 250,000 බැගින් 2024 නොවැම්බර් 20, 2025 ජනවාරි 31 හා අප්‍රේල් 11 දිනැතිව දිස්ත්‍රික්කය වෙත මුදල් නිදහස් කර ඇත. 2024 නොවැම්බර් 15 දිනට පෙර පොදුවේ දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක නිවාස ඉදිකිරීම් කටයුතු අවසන් කළයුතු බව දන්වා ඇත. සමෘද්ධි බැංකුවේ ඇය නමින් ඇති ගිණුමේ රු. 50,000ක මුදලක් රඳවාගෙන සිටින බව දන්වා ඇති බැවින් එම මුදල් නිවසේ වැඩ කටයුතු අවසන් කර 2026 මැයි 15 දිනට පෙර නිදහස් කිරිම සඳහා දිස්ත්‍රික් අධ්‍යක්ෂක වෙත උපදෙස් ලබා දී ඇත.	නිවාස ආධාර ලබාදීමේදී චක්‍රලේඛයේ සඳහන් කාලසීමා හා කොන්දේසි අනුව ඉදිකිරීම් කටයුතු සිදුකරන බව තහවුරු කර ගැනීම සඳහා කාලීන පසු විපරම හා අධීක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු අතර, නියමිත කාලසීමාව තුළ ඉදිකිරීම් අවසන් නොකරන ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(iii)	උක්ත වැඩසටහන යටතේ නිවසක් ඉදිකිරීම සඳහා රු.250,000ක මුදලක් ලද එක්තරා ප්‍රතිලාභියෙකු එම මුදලින් විශාල නිවසකට අත්තිවාරම පමණක් යොදා තිබුණු අතර නිවසෙහි ඉදිරි කටයුතු ආරම්භ කර නොතිබුණි. ඒ අනුව, මෙම වැඩසටහන යටතේ වැය කරන ලද රු.250,000 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. තවද, නිවාස ව්‍යාපෘතියට අදාළ නිර්ණායක යටතේ පවුලේ සාමාජිකයින් 04 දෙනෙකුවත් සිටීම අනිවාර්ය වන අතර වැන්දඹු පවුලක් වීම හෝ ආබාධිත අයෙක් පවුලේ සිටීම හෝ ආර්ථික	ප්‍රතිලාභියාගේ පවුලේ සාමාජිකයින් දෙදෙනෙකු සිටින බැවින් ඔවුන්හට ජීවත් වීමට නිවසක් නොමැති බැවින් ඒ සඳහා කර ඇති අභියාචනය සලකා බලා නිවාස ලොතරැයි භාරකාර මණ්ඩල අනුමැතියෙන් රු. 250,000 ක මුදල නිදහස් කර ඇත. නිරීක්ෂණ චාරිකාවේදී නිරීක්ෂණය වූ පරිදි එම මුදල යොදවා කාමර 03ක්, සාලය හා මුළුතැන්ගෙය ලෙස අත්තිවාරම සකසා ගෙන තිබුණි. නිවසේ ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා ඇය විසින් මුදල් ඉල්ලා නැවත ඉල්ලීම් කළද, පවුලේ සාමාජිකයින් දෙදෙනෙකු පමණක් සිටීම හා නිවාස අරමුදලෙහි	නිවාස ආධාර ලබාදීමේදී අදාළ චක්‍රලේඛ අනුව ප්‍රතිලාභීන්ගේ සුදුසුකම් පූර්වයෙන් තහවුරු කර ගැනීමටත්, ආධාර ලබාදීමෙන් පසු ඉදිකිරීම් කටයුතු කාලීනව අධීක්ෂණය කර, ලබාදුන් මුදල් අපේක්ෂිත අරමුණ සඳහා ඵලදායීව උපයෝජනය වන බව තහවුරු කර ගැනීමටත් ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය.

	මට්ටම සලකා බැලීමේදී දැඩි දරිද්‍රතාවයෙන් පෙළෙන පවුලක් තෝරා ගැනීම වඩාත් සුදුසු බව දක්වා තිබුණද, එම පවුල ප්‍රතිලාභියා සහ ඇයගේ ස්වාමිපුරුෂයා යන දෙදෙනෙකුගෙන් පමණක් සමන්විත වූ බව නිරීක්ෂණය විය.	ප්‍රතිපාදන සීමා සහිත වීම නිසා නැවත ඒ සඳහා මුදල් නිදහස් කිරීමක් සිදු කර නැත. අධික දරිද්‍රතාවය හේතුවෙන් ප්‍රතිලාභියා විදේශ ගත වී ඇති අතර නිවසේ ඉදිකිරීම් කටයුතු හැකි ඉක්මනින් අවසන් කරනු ලැබේ.	
(ඇ)	නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ නිවාස 03ක් ඉදිකිරීම සඳහා සහ එක් නිවසක් අලුත්වැඩියා කිරීම සඳහා රු.2,000,000ක් ලබාදී තිබුණි.		
(i)	එක් ප්‍රතිලාභියෙකු වෙත නිවාස ඉදිකිරීම සඳහා රු.250,000ක් ලබාදී තිබුණද, විගණිත අවස්ථාව වන විට නිවසේ ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබූ අතර කිසිවෙකු පදිංචිව නොසිටියි. තවද, නිවසේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට පෙර සම්පූර්ණ ආධාර මුදල නිදහස් කර තිබූ අතර, නිවස ඉදිකිරීම සඳහා තෝරාගත් ඉඩම ප්‍රතිලාභියා සතු ඉඩමක් නොවුණි. ඒ අනුව, ප්‍රතිලාභියාගේ ඉඩම් අයිතිය හා ඉදිකිරීම් ප්‍රගතිය ප්‍රමාණවත් ලෙස තහවුරු කර ගැනීමකින් තොරව ආධාර මුදල් නිදහස් කර තිබුණි.	ජයවිමන නිවාස ලබාදීම යටතේ රු. 250,000 ක මුදලක් ප්‍රතිලාභියෙකු වෙත නිදහස් කර ඇත. මේ සම්බන්ධයෙන් නිවසේ වැඩ කොටස් නිම කර ගැනීමට ප්‍රමාද වී ඇත්තේ අඹුසැමි ආරවුල් තත්ත්වයක් මත බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත.ඒ අතර ඔවුන් කැඳවා පවුලේ ඇති ගැටුම්කාරී තත්ත්වය නිරාකරණය කර ගැනීමට උපදෙස් ලබාදී ඇති බව දන්වා ඇත. පියාට අයිති ඉඩමක නිවස ඉදිකිරීමට අදාලව අයිතිය සිය මායිම් සහිතව දන්වා වසමේ ග්‍රාම නිලධාරී ඉදිරිපිටදී කැමත්ත ලබාදුන් ලිපියක් ලබාදී ඇත.	ඉදිකිරීම්වල ප්‍රගතියට අනුරූපව වාරික මුදල් නිදහස් කිරීමටත්, ලබාදුන් ආධාර අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා වන බව කාලීන අධීක්ෂණය මඟින් තහවුරු කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ii)	උක්ත ප්‍රතිලාභීන් අතරින් එක් ප්‍රතිලාභියකු වෙත නිවාස අලුත්වැඩියාව සඳහා රු.250,000ක ආධාර මුදලක් ලබාදී තිබූ අතර, අදාළ අලුත්වැඩියා කටයුතු සම්පූර්ණ කර නොතිබියදී අවසන් වාරිකයද නිදහස් කර තිබුණි. ඒ අනුව, අලුත්වැඩියා කටයුතුවල ප්‍රගතිය ප්‍රමාණවත් ලෙස තහවුරු කර ගැනීමකින් තොරව වාරික මුදල් නිදහස් කර තිබුණි.	ප්‍රතිලාභියෙකුගේ නිවස අළුත්වැඩියා කර ගැනීම සඳහා රු. 250,000 ක නිවාස ආධාර මුදල ලබාදී ඇත. එම නිවාස යෝජනාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී, සමාජ සංවර්ධන සහකාර, ප්‍රජාමූල බැංකු කළමනාකරු, ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු, මූලස්ථාන කළමනාකරු හා ප්‍රාදේශීය ලේකම්තුමාගේ, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ නිර්දේශ මත සමෘද්ධි නිවාස ලොතරැයි භාරකාර මණ්ඩල අනුමැතියෙන් පසුව ලබාදෙන ලද්දකි. එම නිවාස අළුත්වැඩියා කටයුතු සිදු කිරීමේදී ඉතා අපහසු මාර්ගයක පිහිටා ඇති නිවසට යාමට මාර්ග පහසුකම් නොමැති වීම හා ආර්ථික මට්ටම ඉතා පහල මට්ටමක පැවතීම නිසා ලබාදුන් රු. 250,000 ක මුදලට ඔවුන් සතු පැරණි දොරක් අළුත්වැඩියා කර නැවත සවිකිරීම සිදු කර ඇත.	නිවාස ඉදිකිරීම් හා අලුත්වැඩියා සඳහා ලබාදෙන ආධාර මුදල් නිදහස් කිරීමේදී අදාළ චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව එක් එක් අදියරේ කාර්යයන් සම්පූර්ණ කර ඇති බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව වාරික මුදල් නිදහස් කිරීමටත්, ඒ සඳහා විධිමත් අධීක්ෂණ හා පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.

(iii)	නියැදි පරීක්ෂාවට ලක් කළ උක්ත නිවාස අතරින් තවත් ප්‍රතිලාභියකු සඳහා රු.750,000ක ආධාර මුදල සම්පූර්ණයෙන්ම නිදහස් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල නිවසේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. විශාල ප්‍රමාණයේ අත්තිවාරම් යොදා ඉදිකිරීම් ආරම්භ කර තිබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අවසන් කර ගැනීමට නොහැකිව පැවතුණි. තවද, අදාල නිවස ඉදිකර තිබූ ඉඩම නිවාසලාභියා සතු නීත්‍යානුකූල හිමිකමක් සහිත ඉඩමක් නොවීය.	මෙය 2024 වර්ෂයේ නිවාස යෝජනාවකි. සමස්ථයක් ලෙස රු. 750,000 නිවාස යෝජනා සඳහා රු. 250,000 බැගින් අදියර 03ක් යටතේ මුදල් නිදහස් කර ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේදීද නිවසේ වැඩ නිමවන ආකාරය අනුව අදියර 03කින් මුදල් නිදහස් කිරීම චක්‍රලේඛ මගින්ද දන්වා ඇත. ප්‍රධාන කාර්යාලය මගින් නිවාස සඳහා දිස්ත්‍රික් වෙත මුදල් ලබා දෙන්නේ නිවාස ලොතරැයි අරමුදල් ආයෝජනයන් කල් පිරීමෙන් අනතුරුව ලැබෙන මුදලිනි. සියළු වාරික මුදල් ඔවුන් වෙත නිදහස් කර ඇත්තේ නිවස විවෘත කිරීමට පෙර වැඩ කොටස් අවසන් කරන බවට ලිඛිත පොරොන්දුවක් ඇතිවය.	චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව ඉඩමේ නීත්‍යානුකූල හිමිකම සහ එක් එක් අදියරේ ඉදිකිරීම් ප්‍රගතිය තහවුරු කර ගැනීමෙන් අනතුරුව පමණක් අදාළ වාරික මුදල් නිදහස් කිරීමට විධිමත් අධීක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය.
(ඇ)	2023 හා 2024 වර්ෂවලදී ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රු.2,750,000ක වියදමක් දරමින් නිවාස 05ක් ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම සිදුකර තිබුණි.		
(i)	2024 පෙබරවාරි 07 දිනැති අංක 2024/03 දරන සමෘද්ධි චක්‍රලේඛයේ අංක 1- “වැඩසටහන් ක්‍රියාත්මක කිරීම” යටතේ නිවාස ඉදිකිරීමේදී විශාල අත්තිවාරම් දැමීමෙන් වැළකිය යුතු බව දන්වා තිබුණද, ප්‍රතිලාභීන් දෙදෙනෙකුට රු.750,000 බැගින් ලබාදී තිබියදීත්, විශාල අත්තිවාරම් දැමීම හේතුවෙන් එම නිවාසවල ඉදිකිරීම් කටයුතු අර්ධ වශයෙන් නිමකර තිබුණි.	එක් ප්‍රතිලාභියෙකුට රු. 750,000 නිවාස යෝජනාවක් සඳහා තෝරාගෙන ඇත්තේ ඔහුගේ බිරිඳ සහ ගැහැණු දරුවන් දෙදෙනා සමඟ ඉතා දුක්ඛිත ජීවිතයක් ගත කිරීම හා කුඩා කටුමැටි නිවසක ජීවත්වීම හේතුවෙන් බව ප්‍රාදේශීය ලේකම් විසින් එවන ලද වාර්තාවෙන් සනාථ වේ. වර්තමානය වනවිට මෙම නිවාසලාභියා, බිරිඳ සහ දරුවන් හට ජීවත්වීම සඳහා ආරක්ෂිතව සිටීමට අවශ්‍ය පරිදි නිවසේ දොර ජනෙල් දමා ප්‍රාදේශීය ලේකම්තුමියගේ මූලිකත්වයෙන් යුතුව නිවසේ පදිංචි කිරීමට කටයුතු සිදු කර ඇත. අනෙක් ප්‍රතිලාභියා සඳහා 2023 වර්ෂයේ රු. 750,000 නිවාස යෝජනාව සඳහා මුදල් නිදහස් කර ඇත. ඔහුගේ පවුලේ ප්‍රතිලාභියා හා කලත්‍රයා සමඟ දරුවන් දෙදෙනෙකි. එම නිවස සඳහා ලබාදෙන ලද රු. 750,000 වටිනාකමට වැඩි නිම් වටිනාකමකින් යුක්තව නිවස ඉදිකර ඇති බව දන්වා ඇත. පැරණි තාවකාලික කටුමැටි නිවස මුළුතැන්ගෙය ලෙස භාවිතා කර ඇත. නව මුළුතැන්ගෙයට අදාල කාර්යය කඩිනමින් සිදු කර ගන්නා බව දන්වා ඇත.	චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව නිවාස සැලසුම් හා ඉදිකිරීම් ක්‍රියාත්මක වන බව තහවුරු කර ගැනීමටත්, ආධාර මුදල් නිදහස් කිරීමට පෙර අදාළ අදියරේ ඉදිකිරීම් ප්‍රගතිය ප්‍රමාණවත් ලෙස සත්‍යාපනය කිරීමටත් විධිමත් අධීක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය.

(ii)	උක්ත ප්‍රතිලාභීන් අතරින් තවත් ප්‍රතිලාභියෙකුට නිවසක් ඉදිකිරීම සඳහා රු.750,000ක් ලබාදී තිබූ අතර, චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව අවසන් අදියර යටතේ රු.250,000ක මුදල නිදහස් කිරීමට පෙර නිවසේ සියලු ඉදිකිරීම් අවසන් කර අවසන් වාර්තාව ලබා ගත යුතු වුවද, නිවසේ ඉදිකිරීම් අවසන් කර නොතිබියදී රු.50,000ක් පමණක් රඳවා ඉතිරි මුදල ගෙවා තිබුණි. එමෙන්ම, විශාල අත්තිවාරම් දැමීමෙන් වැළකිය යුතු බවට වූ චක්‍රලේඛ උපදෙස් ද අනුගමනය කර නොතිබුණි.	විශේෂ නිවාස වැඩසටහන යටතේ රු.750,000 නිවාසයක් සඳහා තෝරාගෙන ඇත්තේ 2024/03 දරණ චක්‍රලේඛය අනුවය. නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා වාරික මුදල් නිදහස් කර ඇති ආකාරයට ඉදිකිරීම් කටයුතු සිදු කළද අවසන් කර ගැනීමට නොහැකි වී ඇත්තේ ඔහුගේ අසාධ්‍ය රෝගී තත්ත්වය නිසාවෙන් බව කරුණු ඉදිරිපත් කර ඇත. ප්‍රතිලාභියාගේ මෙම තත්ත්වය හේතුවෙන් නිවසේ ඉදිකිරීම් කටයුතු අඩාල වී ඇති හෙයින් ඉදිරි මාස 02ක් ඇතුලත නිවසේ ඉදිකිරීම් අවසන් කර පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත.	චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව ඉදිකිරීම් ප්‍රගතිය තහවුරු කර ගෙවීම් සිදුකිරීමටත්, ප්‍රමාණවත් අධීක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1(අ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව අරමුදල විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2025 වර්ෂය තුල ප්‍රසම්පාදන සැලැස්ම සකස් නොකරන ලදී. එයට හේතුව භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍යතාවයක් නොමැතිවීමයි. නමුත් අංශය තුල වසරක සිට ඡායා පිටපත් යන්ත්‍රය වරින් වර අක්‍රිය වී අවධානම් තත්වයක පැවතුනි. ක්‍රමක් ක්‍රමයෙන් එය අක්‍රීයවීම නිසා නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයට අදාල පත්‍රිකා සකස් කර ගැනීම පිළිබඳ ගැටළුවක් ඇතිවිය. මූල්‍ය ප්‍රතිපාදන සලකා බැලීමේ වෙනත් මූලාශ්‍රයන් නොමැති බැවින් හා මෙම අරමුදල සම්බන්ධව ප්‍රසම්පාදන සැලැස්මක් සකසා නොමැති බැවින් ප්‍රසම්පාදන ක්‍රමෝපායන් යටතේ මෙම මිලදී ගැනීම් සිදු කර ඇත.	වාර්ෂික ප්‍රසම්පාදන අවශ්‍යතා කල්තියා හඳුනාගෙන, 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර, එම සැලැස්මට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගොස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 877(1)(ඇ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සකස් කළ අයවැය ලේඛනය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.	2025 වසර සඳහා සකසන ලද අයවැය ලේඛනය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර 2024 ඔක්තෝබර් 23 දිනැති mwca/acc/11/01/2024 අංක දරණ ලිපිය මගින් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගෙන ඇති බව.	අයවැය ලේඛන නියමිත පරිදි අදාළ අනුමැතීන් ලබාගෙන මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීමටත්, ඒ සම්බන්ධ ලේඛන නිසි පරිදි පවත්වා ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	2025 අගෝස්තු 07 දින සහතික කරන ලද අයවැය ඇස්තමේන්තුව, අරමුදලේ ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන නතර කිරීමෙන් අනතුරුව සකස් කර තිබුණද, දිනුම් ඇදීමේ කටයුතුවලට අදාලව ගිවිසුම්ගත සේවා, මූලධන වියදම් හා සංවර්ධන සහාය සඳහා රු.2,500,000ක ප්‍රතිපාදන සලසා ගෙන තිබූ අතර එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. ඒ අනුව, දැනටමත් නතර කර තිබූ වැඩසටහනක් සඳහා ප්‍රතිපාදන අයවැයගත කර තිබීම මගින් අයවැය ඇස්තමේන්තුව සම්පත් අවශ්‍යතා හා අපේක්ෂිත වියදම් නිවැරදිව හඳුනාගැනීම සඳහා ඵලදායී මූල්‍ය සැලසුම්කරණ හා පාලන මෙවලමක් ලෙස ප්‍රමාණවත් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.	පෙර වර්ෂවල පරිදි 2025 වර්ෂයේදීද නිවාස ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන පැවැත්වීමට හැකිවේ යැයි අපේක්ෂා කර අයවැය වාර්තාව හා ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලදී. ගිවිසුම්ගත සේවා යටතේ වෙන් කළද ප්‍රචාරණ වියදම් යනු අවශ්‍ය අවස්ථාවලදී යම් වැඩසටහනක් ප්‍රචාරණය කරමින් මෙහි තත්ත්වය සමාජය වෙත හුවා දැක්වීමට රූපවාහිනි ප්‍රචාරණය මගින් හෝ පුවත්පත් මගින් කරුණු අනාවරණය කිරීම සඳහා තබා ගන්නා ලද මුදලකි. තවද, මෘදුකාංග සංවර්ධන සහායයන් ලෙස පරිගණක වැඩසටහන් සකස් කිරීම හා එම මොඩියුලය සංවර්ධනය කර ගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් නිවාස තොරතුරු ලබාගැනීමට මෙම මුදල වෙන්කර ගත්තද වර්ෂය තුල අවශ්‍යතාවයක් ඇති නොවුණි.	ඉදිරි වර්ෂයේදී අයවැය පිළියෙල කිරීමේදී වඩාත් තාත්වික ලෙස පිළියෙල කිරීමට කටයුතු කළ යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.